**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය - 2019**
---------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල සාධාරණත්වය ඇගැයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ  අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,  අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලැසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 42 ඡේදය අනුව ප්‍රත්‍යාගණන වටිනාකම ගිණුම්ගත කළ යුතු වුවද ඉකුත් වර්ෂයේදී රු.3,500,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු ඉසුසු ලොරි රථය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලැපීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වා ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ප්‍රත්‍යාගණන වත්කම්වල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී අධිකාරියේ ක්ෂය ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය වෙනස්කර තිබුණද 2017 ජනවාරි 01 දිනට පැවති මුළු වත්කම්වලින් එකතුව රු.10,851,120 ක් වූ වත්කම්වලට අදාළ ක්ෂය  ප්‍රතිපත්තිය වෙනස් කිරීමේ බලපෑම අතීතානුයෝගීව ගලපා මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. එසේම 2015 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණු ගොඩනැගිල්ලක් සඳහා 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.681,900 ක ක්ෂය ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාංශු සංරක්ෂණ කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු වියදම රු.16,410,238 ක් වුවද එම ගෙවිය යුතු වියදම රු.1,311,129 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2020 වර්ෂයේ නිවැරදි කරන බව දන්වා ඇත. | උපචිත වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම් රු.1,153,647 ක් අඩුවෙන්ද, සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු රු.2,707,268 ක් වැඩියෙන්ද, අධිකාරියේ කුලී ආදායම රු. 535,500 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබීම යන ගිණුම්කරණ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු. 2,089,121 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජීව විද්‍යාත්මක වත්කම් සහ වෙනත් වත්කම් මිලට ගැනීමට වැය කර තිබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 2,481,857 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ස්ථාවර වත්කම් හා රාජ්‍ය ප්‍රදානයන් ජර්නල් සටහන් මඟින් ගිණුම්වල ගැලපීමේදී ඇති වී තිබුණු ගිණුම්කරණ දෝෂයන් හේතුවෙන් රාජ්‍ය ප්‍රදානයන් හා ස්ථාවර වත්කම් රු.4,864,654 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි බව දන්වා ඇත. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තාව අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | බැංකු මුදල් ශේෂය | 5,238,008 | 6,968,363 | 1,730,355 | 2020 වර්ෂයේ නිවැරදි කරන බව දන්වා ඇත. | අදාල වෙනස්කම් පරික්ෂා කර ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | අවසන් තොගය | 5,856,664 | 4,167,254 | 1,689,410 | 2020 වර්ෂයේ නිවැරදි කරන බව දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103 හා 110 | කොත්මලේ හා පල්ලේකැලේ ගොවිපළ තුළ එකතුව රු.469,157 ක් වූ පැළ හානි වීම්ද පල්ලේකැලේ ගොවිපළ තුළ රු. 635,959 ක් වටිනා කුකුල් පැටවුන් හා තාරාවන් මිය යෑම්ද, බිත්තර අපතයන්ද සිදු වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානයන් අනුව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම සීමාව රු.100,000 ඉක්මවීමේදී භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද ඊට අනුකූල නොවී සීමාව ඉක්මවා රු.2,524,626 ක් අත්තිකාරම් ලබා දී තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිදහස් කර ඇති බව දන්වා ඇත. | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 396 හා 2016 ඔක්තෝබර් 06 දිනැති අංක 06/2016 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | නිකුත් කළ නමුත් මාස 6 ක් ඉක්ම වූ බැංකුවට ඉදිරිපත් නොකළ එකතුව රු. 1,050,321 ක් වූ චෙක්පත් 157 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 7.4.4 ඡේදය | ආයතනයේ පුහුණු අවශ්‍යතා ඇගැයීමට , ආයතනයේ ඉදිරි වෙනස්කම් වෙනුවෙන් සූදානම් වීමට සහ සේවක ඵලදායිතාව වර්ධනය කිරීම වෙනුවෙන් පුහුණු කමිටුවක් පත්කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. පසුගිය වර්ෂ 05 | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තුළ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් දරන ලද රු.3,702,821 ක් සම්බන්ධයෙන් ඇගැයීමක් සිදුකරද නොතිබුණි. | | |
| (ii) 5.1.3 ඡේදය | එක් මූල්‍ය වර්ෂයක් ආරම්භ වීමට අඩුම තරමින් දින 15කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම යාවත්කාලින කරන ලද වාර්ෂික අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | -එම- |
| (iii) 6.5.3ඡේදය | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා 2020 අගෝස්තු 20 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,173,376 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,340,444 ක් විය. ඒ අනුව ඉකුත් වසරට සාපේක්ෂව සමාලෝචිත වසරේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු.12,513,820 ක් විය. අධිකාරියේ ආදායම රු.4,247,766 කින් වැඩිවීම හා වියදම රු.8,266,055 කින් අඩුවීම මෙකී වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.5,568,974 ක් වැයකර ඉදිකරන ලද ඉංගිරිය අලෙවිසැල ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා පොත්වලින් ඉවත් කර ඇති බව දන්වා තිබුණ ද 2020 ජූලි 30 දින වන විටත් පවරාදීමක් සිදු නොකර නිෂ්කාර්යයව පැවතුණි. | පවරාදීම සඳහා අදාළ ලිපි යොමු කර ඇති බව දන්වා ඇත. | පවරා දීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වැලිගම අලෙවිසැල වෙනුවෙන් රු.1,031,114 ක මුදලක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම ආදායමක් උපයාගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | රජයේ තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොත්මලේ හා පල්ලේකැලේ ගොවිපළවල් දෙකෙහි අලාභය රු.9,933,656 ක් වී තිබුණු නමුත් 2015 මාර්තු 04 දිනැති අංක 04/04/07 දරන වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව එම ගොවිපළවල් දෙක සඳහා නිෂ්පාදනය සහ ආදායම් නිශ්චිතව හඳුනාගත් මාසික අනු බෙදීම් සහිත ව්‍යාපාරික සැලැස්මක් සකස් කර ගොවිපළවල් ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. | සැලසුම් කළ පරිදි අදාළ කාර්යයන් සිදු කළ යුතු වීම. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව හදබිම අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු.54,912,000 ක් දක්වා තිබුණද හදබිම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂයක් නොතිබූ අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලැබිය යුතු ශේෂය රු.2,094,280 ක් ලෙස දක්වා තිබුණ අතර මෙකී ශේෂයන්ගේ පරස්පරතාවයන් නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොත්වලින් කපා හැරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාංශු සංරක්ෂණ ආදර්ශණ සකස් කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී ලබාදී තිබූ රු.4,368,321 ක අත්තිකාරම් මුදලක් එම කාර්යය ඉටු කිරීමෙන් තොරව වර්ෂයකට අධික කාලයක් මුදල් නිෂ්ක්‍රීයව තබාගෙන සමාලෝචිත වර්ෂයේදී පියවා තිබුණි. | ප්‍රතිපාදන මුදල් නොලැබීම හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වා ඇත. | නිවැරදිව ව්‍යාපෘති සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයෙහි (අ) හා (ඇ) අධිකාරිය විසින් ඉටුකර ගැනීමට සැළසුම් කළ රු.11,880,000 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු ද කොත්මලේ හා පල්ලේකැලේ ගොවිපළවල්වල රු.900,000 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම් හා රු.200,000 ක් වටිනා අළුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු ද සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.5 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ආයතනනට අදාල ඉඩම් විධිමත්ව පවරා ගැනීමකින් තොරව අධිකාරිය විසින් ඉකුත් වර්ෂ වලදී රු.5,724,114 ක් හා සමාලෝචිත වර්ෂය තුළ රු.3,176,631 ක් වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණද එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අදාළ කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට පැවති අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය අනුව අධිකාරියේ තනතුරු 11 කට අයත් පුරප්පාඩු 18 ක් ඇති වී තිබුණද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව දන්වා ඇත. | පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා 2005 වර්ෂයෙන් පසුව ද්විතියන පදනම මත නිලධාරීන් 03 දෙනෙකු සේවය කර තිබුණු අතර 2017 අගෝස්තු මාසයෙන් පසු කිසිදු නිලධාරියෙක් පත්කර නොතිබුණි. | ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව දන්වා ඇත. | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |